පානදුර ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට විදුලි ගබඩා තොග ශේෂය රු.397,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව වරිපනම් බදු වැඩියෙන් බිල් කිරීමෙන් වර්ෂය තුළ කපා හරින ලද රු.1,128,611 ක මුදල වර්ෂයේ බිල් කල ආදායමින් අඩුකර දැක්විය යුතු වුවත් ඌනතා අතිරික්තතා ගිණුම හර කර වරිපනම් බදු රැස් කිරීමේ ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.1,128,611 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මුද්දර ගාස්තු ආදායමින් හිලව් කිරීමේ පදනම මත පළාත් පාලන අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු.3,777,750 ක් වටිනා ට්‍රැක්ටර් 02 හි හා ට්‍රේලර් 02 හි වටිනාකම, අයකර ගත හැකි උපයෝගී සේවා ගිණුම හර හා පළාත් සභා ණය ගිණුමට බැර කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළව පළමු වැඩසටහනෙහි ප්‍රාග්ධන වැය එකතු වටිනාකම සාරාංශ වියදම් වාර්තා වලට අනුව රු.1,565,126 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,028,240 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන වැය වටිනාකම රු.536,886 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ වියදම් ණය හිමි වටිනාකම හා වර්ෂයේ වියදම රු.43,272 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) කි.මී.1000 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව කර්මාන්ත 04 ක් වෙනුවෙන් හා විමධ්‍යගත අරමුදල් කර්මාන්තයක් වෙනුවෙන් ණයහිමි වටිනාකම රු.1,290,118 ක් වැඩියෙන් හා සභා කර්මාන්ත ණයහිමි වටිනාකම රු.206,967 ක් අඩුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමි වටිනාකම හා කර්මාන්ත වියදම රු.1,083,151 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.9,710,453 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.9,763,291 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.52,838 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පත් ආයෝජන වටිනාකම ආයෝජන සහතික පත්‍ර අනුව රු.94,021,190 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.94,551,268 ක් ලෙස දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ආයෝජන වටිනාකම රු.530,078 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) 2016 වර්ෂයේදී වැටුප් රහිත නිවාඩු ලබා සිටි සේවකයින්ගෙන් අයකර ගත් රු.381,929 ක මුදල් ප්‍රවර්තන වර්ෂයේ වියදම් ආපසු ලැබීමක් ලෙස වැටුප් හා වේතනවලින් අඩුකර දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන වියදම රු.381,929 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>**නොසැසඳුණු ගිණුම්**</u>

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.221,514,261 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.12,254,050 ක නොසැඳීම් නිරීක්ෂණය විය.

1.3.3 <u>**ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**</u>

<u>ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.3,470,393 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල රු.2,916,490 ක් විය.

1.3.4 <u>**විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**</u>

යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, අත්තිකාරම් ලේඛනය, ණයහිමි ලේඛන, තැන්පත් ලේඛන හා අදාළ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.101,201,425 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 149 වගන්තිය | --- | 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පොලකින් එම ආයතනවල මුළු ආදායමින් සියයට එක දක්වා වූ ගාස්තුවක් අය කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | --- | සභාව සතු සියළු ඉඩම්, ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 2,773,982 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය නිම වූ විගසම පියවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඈ) | 5,247 | නිකුත් කර ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවා තිබූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 (1) හා (2) | 2,923,112 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර කල් ඉකුත් වූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 1647(ආ) | --- | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1997 දරන ගැසට් පත්‍රය | 177,490 | ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම සහ ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් ගාස්තු අයකළ යුතු වුවත් නියැදි විගණන භෞතික පරීක්ෂාවට අනුව වාද්දුව උප කාර්යාල ප්‍රදේශයේ ගාස්තු අය කළ යුතු ප්‍රචාරක දැන්වීම්/ නාම පුවරු 37 ක් සඳහා ගාස්තු අය කර නොතිබුණි. |
| (ඉ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | --- | පරිසර බලපත්‍ර නිකුත් කළයුතු ආයතන 20 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2:1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.65,254,035 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.85,717,536 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2:2:1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 26,575,000 | 32,642,175 | 30,827,066 | 28,940,466 | 26,345,500 | 29,026,502 | 28,222,569 | 27,515,429 |
| (ii) කුලි | 10,135,500 | 3,069,708 | 3,240,845 | 3,617,915 | 14,711,000 | 3,080,635 | 3,184,080 | 3,789,053 |
| (iii) බලපත්‍ර ගාස්තු | 475,500 | 474,200 | 477,750 | 500 | 401,000 | 453,104 | 455,804 | 4,050 |
| (iv)වෙනත් ආදායම් | 79,305,500 | 61,002,500 | 57,344,046 | 70,379,045 | 93,659,000 | 76,005,000 | 76,860,185 | 74,157,687 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.105,466,219 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් රු.97,188,583 ක් විය. වර්ෂය තුළ ලැබීම් කපා හැරීම් හා ගැලපුම් රු.99,716,876 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් හිඟය රු.102,937,926 ක් විය.

2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම්

i. සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ශේෂය රු.22,651,829 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.11,761,770 ක් හෙවත් සියයට 52 ක් පමණක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ආදායම් වාර්තාව හා හිඟ වරිපනම් ලේඛනය අතර රු.4,458,682 ක වෙනසක් විය.

iii. සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම රු.29,169,233 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.18,097,668 ක් හෙවත් සියයට 62.4 ක් පමණක් අයකරගෙන තිබුණි.

iv. සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම් වාර්තාව අනුව හිඟ වරිපනම් බදු ආදායම රු.21,961,624 ක් වූ නමුත් මූලා ප්‍රකාශන අනුව හිඟ වරිපනම් බදු ආදායම රු.28,733,105 ක් වූයෙන් රු.6,771,481 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 කුලී

කඩ කුලී

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කඩකුලී ආදායම රු.3,671,630 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.280,350 ක් හෙවත් සියයට7.64 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා කඩ කුලී බිල් කිරීම රු.3,069,708 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.2,750,483 ක් හෙවත් සියයට 89.60 ක් පමණක් අයකර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ හිඟ කඩ කුලිය රු.3,710,505 ක් විය.

(ඇ) පොදු වෙළඳ පොළ කඩකුලී නව තක්සේරුව අනුව 2015 වර්ෂයේ සිට කඩකුලී සංශෝධනය වී තිබූ නමුත් ඒ අනුව ආරක්ෂිත ඇප අයකර ගැනීමට හා නව තක්සේරුව මත ගිවිසුම් ගත වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පොදු වෙළඳ පොළ පළමු අදියර කඩ කාමර 06 කින් , දෙවන අදියර කඩ කාමර 09 කින් හා තුන්වන අදියර කඩ කාමර 05 කින් නෛතික ගිවිසුමකින් තොරව කුලී මුදල් පමණක් අය කරමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ඉඩහැර තිබුණි.

(ඉ) පොදු වෙළඳ පොළ තෙවන අදියර අංක 02 මස් වෙළඳ සැල 2014 මාර්තු 01 සිට අවුරුදු තුනක් සඳහා රු.10,250 ක මාසික බදු මුදලකට ලබා දී තිබුණි. බදු කාලය 2017 මාර්තු 01 දිනෙන් අවසන් වුවත් නැවත ටෙන්ඩර් කර බදු දී නොතිබුණු අතර 2014 වර්ෂයේ බදු මුදල පදනම් කරගෙන 2017 වර්ෂයේදීද බදු මුදල් අයකර ගෙන තිබුණි.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.4,716,190 ක් හා මුද්දර ගාස්තු රු.65,651,305 ක් විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා කිසිවක් පනවා ගෙන නොතිබුණි.

(ආ) <u>ප්‍රතිපාදන නොසැලසීම</u>

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ඇ) <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 50 ක් වූ නමුත් වර්ෂය තුළදී ඉන් 38 ක් ක්‍රියාත්මක නොකර ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් නොකරන ලද ව්‍යාපෘති 38 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) **<u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

සභාව විසින් කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම නිසා 2017 වර්ෂයේ කසළ බැහැර කිරීම සඳහා රු.11,230,040 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබූ අතර එම වියදම සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායමින් සියයට 38 ක ප්‍රමාණයක් විය.

(ඉ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජූනි 11 දින වන විටත් සකස් කර නොතිබුණි.

3:2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 අනුව ස්ථිර කරන ලද සේවකයින් 10 දෙනෙකු ප්‍රාථමික අංශයේ තනතුරු සඳහා අනුයුක්ත කර ගෙන තිබුණත් මෙම සේවකයින් අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් කර ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ද්විතීයික කාර්යය මණ්ඩලයේ තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 13 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණ අතර ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ තනතුරු 05 සඳහා නිලධාරීන් 19 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට ආදේශක සේවකයින් 28 දෙනෙකු හා ව්‍යාපෘති සේවකයින් 03 දෙනෙකු විය.

(iv) 2006 වර්ෂයේ සිට නුපුහුණු කම්කරුවෙකු ලෙස සභාවට ස්ථාන මාරු වී පැමිණි මොරටුව මහ නගර සභාවේ සභික ධූරයක් දැරූ එක් සේවකයෙක් 2015 සිට 2016 නොවැම්බර් දක්වා පැමිණීමේ ලේඛනයේ අත්සන් තැබීම පමණක් සිදු කර සභාවට කිසිදු සේවයක් සිදු නොකර තිබියදී වැටුප් ලෙස රු.724,695 ක මුදලක් ගෙවා තිබුණි. 2016 ජූලි 18 දින සිට 2017 දෙසැම්බර් දක්වා සේවයට වාර්තා කර නොමැති මෙම සේවකයාට කාර්ය පරිපාටි සංග්‍රහයේ 12 වන පරිශිෂ්ඨයේ 172 වගන්තිය පරිදි සේවය හැරයාමේ නියෝගයද නිකුත් කර නොතිබුණි. කෙසේ වුවද 2018 මාර්තු 23 වන දින සේවය අතහැර ගිය බව දැනුම් දී ඇති බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(v) කොළඹ මහ නගර සභාවේ සිට අනුප්‍රාප්තිකයකු රහිතව 2015 පෙබරවාරි මාසයේ ස්ථාන මාරු වී පැමිණි රියදුරකු පැමිණීමේ හා පිටවීමේ ලේඛනයෙහි අත්සන් තැබීම පමණක් සිදුකර තිබියදී එම රියදුරාට 2015 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා රු.248,605 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. තවද 2015 සැප්තැම්බර් සිට නැවත කොළඹ මහ නගර සභාවට ස්ථාන මාරු වී ගිය යථෝක්ත රියදුරාට 2015 ඔක්තෝබර් සිට 2017 නොවැම්බර් දක්වා වැටුප් ලෙස රු.862,927 ක මුදලක් ගෙවා තිබුණි.

(vi) දිගින් දිගටම වැටුප් රහිත නිවාඩු ලබා සිටි සේවකයින් 22 දෙනෙකු සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) <u>සේවක ණය</u>

මියගිය, ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය සේවකයින් 24 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු ණය ශේෂය රු.1,180,939 ක් විය.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) <u>තොග පාලනය</u>

(i) ප්‍රධාන කාර්යාලයෙන් ලැබෙන විදුලි භාණ්ඩ හා විදුලි අංශයට නිකුත් කරනු ලැබූ විදුලි භාණ්ඩ එක් එක් දිනට ශේෂය දැක්වෙන ලේඛනයක් උපකාර්යල මගින් නඩත්තු කර නොතිබුණි.

(ii) වාද්දුව උප කාර්යාලය විසින් විදුලි අංශයට නිකුත් කරනු ලැබූ භාණ්ඩ පිළිබඳව ගබඩා ලේඛනයේ සටහන් කර නොතිබුණි. එසේම විදුලි අංශයට ලබාගත් බල්බ අනුක්‍රමික අංකය අනුව සටහන් කර ගෙන නොතිබූ අතර විදුලි කණුවලට බල්බ සවිකිරීමේදීද අනුක්‍රමික අංකවලට අනුකූලව සවිකර නොතිබුණි.

(iii) ගලවා ඉවත් කරනු ලැබූ බල්බ නියමිත ආකාරයට ගබඩාවට භාර දී නොතිබූ අතර වගකීම් කාලය ඉකුත්නොවූ බල්බ නැවත මාරු කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>වීථි පහන් බිල්පත් පියවීම</u>

කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත් ප්‍රදේශ වල වීථි පහන් සඳහා සේවා සැපයීම හා අළුත්වැඩියා කටයුතු සභාව විසින් සිදුකර තිබියදී වීථි පහන් දැල්වීම වෙනුවෙන් 2017 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ගිවිසුමකින් තොරව ලංකා විදුලි පුද්ගලික සමාගමට රු.766,722 ක මුදලක් ගෙවා තිබුණි.

3:4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම</u>

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.1,192,665 ක් වටිනා ලීබඩු හා සවි කිරීම්, රු.2,987,929 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා රු.3,803,625 ක් වටිනා මෝටර් රථ හා කරත්ත ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබුණි.

(ආ) සභාව විසින් නඩත්තු කරනු ලැබූ ස්ථාවර වත්කම් ලේඛනයෙහි සභාව සතු ඉඩම් ලෙස හඳුනාගෙන තිබූ ඉඩම් 34 කට අදාලව ඉඩමේ නම, වටිනාකම හා ඔප්පු අංක ඇතුළත් කර නොතිබුණ අතර ඉඩම් වලට අදාළ ඔප්පු සභාව සතුව නොතිබුණි.

3.4.2 <u>නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම</u>

සමාලෝචිත වර්ෂයේ ජල සැපයුම් ලබා ගැනීම සඳහා මාර්ග 194 ක් පළුදු කිරීම වෙනුවෙන් රු.2,291,859 ක මුදලක් සභාවට ලැබී තිබූ නමුත් වර්ෂය තුළදී අළුත්වැඩියා කර තිබුණේ ඉන් මාර්ග 30 ක් පමණි.

3.5 <u>ප්‍රසම්පාදනය</u>

3.5.1 <u>සැපයීම් හා සේවා</u>

කසළ බැහැර කිරීම සඳහා සේවා ආයතනයක් තෝරා ගැනීමේදී අඩුම මිල ඉදිරිපත් කල ආයතනය තෝරා නොගෙන වැඩිම මිළ ඉදිරිපත් කල ආයතනයට ටෙන්ඩරය පිරිනමා තිබූ අතර එම ටෙන්ඩරය ලබාගත් ආයතනය විසින් කසළ බැහැර කරනු ලබන ස්ථාන සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. ටෙන්ඩරය පිරිනමා තිබූ කසළ බැහැර කිරීමේ ආයතනය සමඟ ඇතිකරගෙන තිබූ ගිවිසුම මාසයක කාලයක් සඳහා පමණක් වුවත්, වර්ෂය පුරාම එකී ගිවිසුම ක්‍රියාත්මක කර තිබූ අතර කසළ බැහැර කිරීමේ කටයුතු නිසි අධීක්ෂණයක් යටතේ සිදු වී නොතිබුණි.

3.5.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

<u>කර්මාන්ත ඉටු කිරීමේ දුර්වලතා</u>

(අ) <u>බෙත්තේගම බෝගහපාර වමට ඇති පළමු අතුරු මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම</u>

(i) මාර්ගයේ දිග මීටර් 53.8 සිට 64 දක්වා , පළල මීටර් 0.23 අඩුවෙන් කොන්ක්‍රීට් කර තිබුණු අතර පසු අවස්ථාවක ලැලි යොදා මීටර් 0.23 ක කොන්ක්‍රීට් කිරීම නිසා එම කොටස නිසි පරිදි මාර්ගය හා සම්බන්ධ වී නොතිබුණි.

(ii) මාර්ගයේ තිබිය යුතු ගැඹුර මීටර් 0.125 විය යුතු වුවත්, මීටර් 29.5 ස්ථානයේදී ගැඹුර මීටර් 0.089 ක් ද , මීටර් 46.4 ස්ථානයේදී ගැඹුර මීටර් 0.10 ක් ද, මීටර් 53.8 ස්ථානයේදී ගැඹුර මීටර් 0.10 ක්ද විය.

(iii) මාර්ගයේ පළල නිසි පරිදි හඳුනාගත නොහැකි ආකාරයට දෙපසට කොන්ක්‍රීට් වත්කර තිබුණි.

(iv) කොන්ත්‍රාත්කාර සමිතියේ මූල්‍ය හා කාර්ය සාධන හැකියාව පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය නොතිබුණි.

(ආ) <u>වැකඩ නැගෙනහිර පහත්ගම ප්‍රධාන මාර්ගය අවසාන වන තෙක් සංවර්ධනය කිරීම</u>

(i) අවසාන ගෙවීම් වාර්තාව අනුව මීටර් 207 ක් තාර යෙදිය යුතු වුවත් මීටර් 172 ක් පමණක් තාර යොදා තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) මාර්ගයේ ස්ථාන කිහිපයක ගල් මතු වී තිබුණි.

(iii) කොන්ත්‍රාත්කාර සමිතියේ මූල්‍ය කාර්යය සාධන හැකියාව පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය නොතිබුණි.

(ඇ) <u>පානදුර කුරුප්පුමුල්ල ෆොන්සේකා වත්ත පාර බැවුම් කොටස සංවර්ධනය කිරීම</u>

(i) මාර්ගයේ දිග මීටර් 65.15 ක් වුවත් මීටර් 58.8 ක් පමණක් ඉටු කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්කාර සමිතියේ මූල්‍ය කාර්යය සාධන හැකියාව පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය නොතිබුණි.

(ඈ) <u>අඹගහවත්ත කාණු පද්ධතිය සකස් කිරීම</u>

මෙම ව්‍යාපෘතියේ කොටසක් රු.253,577 ක ඇස්තමේන්තුවකට ඉටු කර තිබුණු අතර ඉතිරි කොටස නිම නොකිරීම නිසා ඒ අවට පදිංචි නිවෙස් ජලයෙන් යටවන තත්ත්වයක් ඇතිවී තිබුණි.

## 4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

### 4:1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 13 සිට සියයට 85 දක්වා, සහ වියදම් සියයට 03 සිට සියයට 96 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් වලින් අත් හැරීම් හා අඩුවෙන් හා වැඩියෙන් සටහන් වීම් තිබීම |
| | ii. ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| (ආ) වත්කම්/ දේපළ | i. ලේඛන ගත නොකිරීම |
| | Ii. ආරක්ෂාව තහවුරු නොකිරීම |
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ බදු අයකිරීම ප්‍රමාණවත් පරිදි සිදු නොවීම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තොග | i. | ලේඛන ගත නොකිරීම |
| | | ii. | අවිධිමත් තොග පාලනය |
| | | iii. | ලැබීම්, නිකුත් කිරීම් පිළිබඳ අධීක්ෂණයක් සිදු නොවීම |
| (ඉ) | ණයගැති/ණය හිමි | i. | උපලේඛන පිළියෙල නොකිරීම |
| | | ii. | කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| (ඊ) | සේවක කළමනාකරණය | i. | කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම |
| | | ii. | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (උ) | අපද්‍රව්‍ය කළමණාකරණය | | විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවීම |
| (ඌ) | අයවැය පාලනය | i. | අයවැයගත හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම |
| | | ii. | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |
| (එ) | ව්‍යාපෘති/කොන්ත්‍රාත් | | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොවීම |